ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය

01) ප්‍රතික්‍රියක වල සාන්ද්‍රණය ප්‍රතික්‍රියා සීඝ්‍රතාවයට බලපාන අයුරු පරීක්ෂා කිරීමට අදාළ ඇටවුම පහත දැක්වේ. සෑම පරීක්ෂණ නලයකම අඩංගුවන ජල පරිමාව සමාන වේ.



i) ඉහත නලවල අම්ල සාන්ද්‍රණය වැඩිවන අනුපිළිවෙල සඳහන් කරන්න.

ii) වායු බුබුළු පිටවන සීඝ්‍රතාවය වැඩිම නලය කුමක්ද?

iii) මෙම ක්‍රියාකාරකමෙන් එළඹිය හැකි නිගමනය කුමක්ද?

02) i) ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය කෙරෙහි බලපාන උත්ප්‍රේරක යනු මොනවාද?

ii) උත්ප්‍රේරක ප්‍රතික්‍රියා සීඝ්‍රතාවය කෙරෙහි බලපාන අයුරු පරීක්ෂා කිරීමට අදාළව ඔබේ පෙළපොතේ දැක්වෙන ක්‍රියාකාරකම 17.4 (පිටු අංක 122) වෙත ඔබේ අවධානය යොමු කරන්න. එහි උත්ප්‍රේරක ලෙස යොදාගෙන ඇති රසායන ද්‍රව්‍යය කුමක්ද?

iii) මෙම ප්‍රතික්‍රියාවට පසුව ද්‍රාවණය පෙරා MnO_2 ඉවත්කර වියලා ස්කන්ධය මැන බැලූවිට එහි ස්කන්ධයෙහි නිරීක්ෂණය කළ හැකි වෙනස කුමක්ද?

iv) විවිධ කර්මාන්ත හා කාර්මික ක්‍රියාවලිවලට උත්ප්‍රේරක භාවිත වන අවස්ථා සඳහා උදාහරණ දක්වන්න.

03) පහත එක් එක් රසායනික විපර්යාසවලදී ලැබෙන නිරීක්ෂණ සඳහන් කරන්න.

	රසායනික ප්‍රතික්‍රියාව	නිරීක්ෂණය
I	$CaCO_3 \longrightarrow CaO + CO_2$	
II	$2HCl + Mg \longrightarrow MgCl_2 + H_2$	
III	$2H_2O_2 \longrightarrow 2H_2O + O_2$	
IV	ආම්ලික $KMnO_4$ හා Fe අතර ප්‍රතික්‍රියාව	